# ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

## අධ්‍යාපන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව, රටේ රාජ්‍ය අංශ විද්‍යාඥයන්ට මූල්‍යමය සහාය ලබාදෙන රජයේ අරමුදල් සපයන නියෝජිතායතනය වේ.

ජාතික පර්යේෂණ සභාවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම්ලත් පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## විද්‍යාත්මක / පර්යේෂණ නිලධාරී - AR 1 - තනතුරු - 01

**රැකියා විස්තර** : පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති තොරතුරු පළකිරීම, දත්ත සමුදාය නඩත්තු කිරීම, සංඛ්‍යානමය විශ්ලේෂණය, වාර්තා පිළියෙල කිරීම සහ සම්මන්ත්‍රණ / වැඩමුළු වැනි දෑ සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම් දැරීම

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයන් (1 හෝ 2)**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යා, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යාතිය, ICT පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, පරිගණක ඉංජිනේරු විද්‍යාව, හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක්.

**හෝ**

2. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යාතිය, ICT පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයේ සාමාන්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්.

**වයස** : අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා අදාළ නොවේ.

**වැටුප් පරිමාණය** : AR 1-2016 [රු. 53,150/- 10X1,375/- 15X1,910/- 95,550]

## ප්‍රසම්පාදන නිලධාරී - JM 1-1 - තනතුරු - 01

**රැකියා විස්තර** : ජාතික පර්යේෂණ සභාව / ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කාර්යක්ෂම කළමනාකරණයට සහාය දක්වන සියලුම ප්‍රසම්පාදන / කොන්ත්‍රාත් ආශ්‍රිත කරුණුවලට වගකීම් දැරීම.

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයන් (1 හෝ 2)**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ව්‍යාපාර පරිපාලන, ගණකාධිකරණය, කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ ප්‍රථම උපාධියක්.

**සහ**

රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පශ්චාත් උපාධි පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයන් :**

1. ඉහත බාහිර අපේක්ෂකයන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පථයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) II වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සාර්ථක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා අදාළ නොවේ.

**වැටුප් පරිමාණය** : JM 1-1-2016 [රු. 42,600/- 10X755/- 18X1,135/- 70,580]

### සියලුම තනතුරු සඳහා අදාළ වන අනෙකුත් කොන්දේසි :

1. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. තනතුරට අදාළ කාර්යයන් මැනවින් ඉටුකිරීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අයදුම්කරුවන් ශාරීරිකව හා මානසිකව යහපත් තත්ත්වයකින් සිටිය යුතුය.
3. විශිෂ්ඨ චරිතයක් හෙබිවිය යුතුය.
4. ලිඛිත විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.
5. පත්වීම ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.
6. අයදුම්කරුවන්, තමන් විසින් අත්සන් තබන ලද අයදුම්පත්, උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ සහතික සමග ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග, කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර 2024 මැයි 26 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "සභාපති, ජාතික පර්යේෂණ සභාව, 120/7, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.
7. දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවා නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
8. ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ මෙම දැන්වීම ජාතික පර්යේෂණ සභාවේ www.nrc.gov.lk යන වෙබ් අඩවියේ පළකොට ඇත.

**සභාපති,**
**ජාතික පර්යේෂණ සභාව,**
120/7, විද්‍යා මාවත, කොළඹ 07.

**දුරකථන අංක : 011-2675176, 2675430, ෆැක්ස් : 011-2675136**